සිටි ආකාරය පිළිබඳව සංවේදී සිතුවිලි සහාද මනසට ප්‍රවේශ කරවන්නට මෙම පද පෙළ සමත් වෙයි.

සිංහල සමාජය තැළ තව දුරටත් දැකගත හැකි පරගැති සිරිතට යොමු වීමේ ප්‍රවණතාව මෙම නිර්මාණ කරුවා දකින්නේ ද කිසියම් ආකාරයක ප්‍රබල හැඟීම් භාවාත්මක ලෙසම නොව රසවත් ලෙස මතු කරලමිනි.

"අපට නොරිසි පරගැති සිරිතට ගරු කෙරුමට නොව නුඹ දිනුවේ . . . . . "

යනාදී වශයෙන් තමන්ගේම ආගම, ජාතිය, සිරිත්විරිත් ඇගයීමටත් පර සිරිත්වල තව දුරටත් එල්බ නොගෙන දේශීය සංස්කෘතිය ඔපවත් කර ලමින් වටිනා ජීවිත ගෙවන්නටත් මෙම පියා තම දියණියට කියන අතරම එම යහපත් පණිවුඩය සමස්ත සමාජය දෙසටම විහිදුවා හරියි.

ගීතයක් වූ කලී, ඉහත සඳහන් කළ පරිදි රස දනවන අතරම, එහි පදවැල මගින් සමාජය වඩා හොඳ මගකට යොමු කරවීමටත් නිර්මාණය වන්නක් විය යුතු බව ප්‍රේමකීර්ති ද අල්විස් නම් වූ විශිෂ්ට ගී පද රචකයා අපට පෙන්වා දී ඇත. එපමණක් නොව මෙවන් අගනා අර්ථවත් ගී පද මාලාවක් සුන්දර ගීතයක් ලෙස නිමවීමට හැකිවීම පුදුමයක් නොවේ. සමාජය තුළ ද්වේෂසහගත සිතුවිලි වර්ධනය කරනු වෙනුවට මෙබඳු දයාබර සංවේදී හැඟීම් මතු කර ලන කලාකරුවා සැබවින්ම විශිෂ්ට නිර්මාණ කරුවෙකි.

වර්තමාන ශ්‍රී ලාංකික සමාජය තුළ දරු-වන්ගේ අධ්‍යාපනය කොයිබටද යන ප්‍රශ්නයට තවමත් නිසි පිළිතුරු අපට හමු වී නැත. එදා සමාජයේ බාල දරුවන් අධ්‍යාපනය ලැබුවේ සිය ජීවිතයේ අගනාම අවදියක් වන ළමා වියේ සුන්දරත්වය ද නොමඳව විඳගනිමිනි. එහෙත් අවාසනාවකට මෙන් අද දරුවනට සිදු වී ඇත්තේ, අද අප අතර සිටින විශිෂ්ට ගී පද රචකයකු වන සිසිර දිසානායක ලියන පරිදි,

"ඉරෙන් හඳෙන් වසන් වෙමින්
කෙළි ලොල් විය යන්නේ
පොතින් පතින් නැණ නුවණින්
තරඟය ජය ගන්නේ

ඇදුරන් සැනැහෙන්නේ - නුඹෙ
දෙගැරුන් සැනැහෙන්නේ"

යනුවෙන් සඳහන් වන ළමා ලෝකයේ කෙළිලොල් විය අහිමි වෙමින් පොත පතේ දැනුම පමණක් සෙවීමට යොමු කරනු ලැබ

<u>වර්තමාන ශ්‍රී ලාංකික සමාජය තුළ දරුවන්ගේ අධ්‍යාපනය කොයිබටද යන ප්‍රශ්නයට තවමත් නිසි පිළිතුරු අපට හමු වී නැත. එදා සමාජයේ බාල දරුවන් අධ්‍යාපනය ලැබුවේ සිය ජීවිතයේ අගනාම අවදියක් වන ළමා වියේ සුන්දරත්වය ද නොමඳව විඳගනිමිනි.</u>

ගීතයක් බවට පත් වී ඇත්තේ රෝහණ විරසිංහ නම් වූ විශිෂ්ට සංගීත නිර්මාපකයාගේ මනහර සංගීතයෙනුත් මාලිනී බුලත්සිංහල ගායිකාවගේ මිහිරි ගායනයෙනුත් බව ප්‍රකටය.

පරම්පරා පරතරය කවර සමාජයක වුවද දැකගත හැකි, එක්තරා විදියක සමාජයට අයහපත් බලපෑම් ද ඇති කළ හැකි සාධකයකි. කවර පරම්පරාවකට අයත් වුවන් ගත්තද, තමන්ගේ යහපත් බවත් බාල පරපුරේ අයහපත් බවත් කියා බාලයන්ට දොස් පැවරීමට යොමු වන අයුරු දක්නට ලැබේ. මෙහිදී වැඩිහිටියන් අවබෝධ කර නොගත් කරුණක් නම්, සමා-ජයක හෝ සංස්කෘතියක හෝ අඛණ්ඩව සිදු වන වෙනස්කම් සමග ඉදිරි පරපුර ද සිතැවිලි අතින් මෙන්ම ක්‍රියාකලාපය අතින් ද වෙනස් මගක යන බවයි. ඇතැම් විට තරුණ තරුණ-යන්ගේ ප්‍රේම සම්බන්ධතා පවා නුරුස්සන ඇතැම් වැඩිහිටියන් ඒ දෙස ද්වේෂයෙන් බලා අඳහස් දක්වන්නට, විවේචනය කරමින් ඔවුන් හෙළා දකින්නට පෙලඹෙන අවස්ථා එමටය. මෙබඳු තත්වයක පවත්නා එක්තරා විදියක අසාධාරණ බව තේමා කොටගනිමින් රවි සිරිවර්ධන නම් වූ ගීත රචකයා නිර්මාණය කළ මතු දැක්වෙන ගීතය, රෝහණ විරසිංහ කලාක-රුවා යෙදූ මිහිරි සංගීතයෙන් ඔපවත් වී සුනිල් එදිරිසිංහ ගායකයා විසින් රසික අප වෙත ගෙන එනු ලබන්නේ සැබවින්ම අරුත්බර ගීතයක් ලෙසිනි.

"මල් පිපිලා එදා වගේ බලන්න මැණිකේ
බමරු ඇඳෙනවා සුවඳට සතර දිගන්තේ
තරන නොගෙන සාදු සාදු කියන්න මැණිකේ
එදා අපට පෙම්වත් සඳ අද දරුවන්ටයි
ගලා හැළෙන නිල් ඇළලොල පෙම් කවියක් වෙයි
එදා අප වෙළී ගිය මග මෙදා උන් බැඳී යන සඳ
තරහ නොගන්ටයි
කෝඩුකාර පෙම්බස් දැන් ඉතින් ඔවුන්ටයි
රෑට පිපෙන තරුමල්වල රේණු ගහින්ටයි
එදා අප තැනූ මාළිග මෙදා උන් තනාගත් සඳ
කඩා නොලන්ටයි"

අර්ථය වශයෙන් ගෙන බැලුවත් ඉහළ මට්ටමක රසඥතාවක් ඇති කරවන මෙම ගීයෙහි නිර්මා-ණකරුවා යොදාගෙන ඇති පදමාලාවෙහි ළයාන්විත බව සුනිල් එදිරිසිංහගේ සංවේදී, මිහිරි ස්වරයෙන් අප වෙත ගලා එන්නේ තවතවත් සොඳුරු සිතුවිලි අප මනසට එක් කරලමිනි. දක්ෂ, ප්‍රතිභා පූර්ණ ගීත රචකයකුට සිය පෑන් තුඩින් ගලා එන අර්ථවත් මෙන්ම ගීතමය වූ ද පද මාලාවක් මෙවන් සාර්ථක සිටින පිරිසක් වීමටයි.

"ඉදල් රටා මිදුල් පුරා
ඇඳෙනා මේ පින්නේ
නිමල් සිනා කමල් හගා
කොහෙදෝ මේ යන්නේ

වතුසුදු මල් වැන්නේ . නුඹ
ගැරු ගෙදරද යන්නේ . . . ."

ළමා වියේ අප ලද අත්දැකීම් ලෙස මනසේ රැඳී ඇති 'ඉදල් රටා' මෙන් මිදුල අතුගෑමේ සුන්දර කර්තව්‍යය දර්ශනයට ලක් කරගනිමින් මේ සිගිති දරු පරපුර ද අද උදෑසනින් ගුරු ගෙදරට ගොස් ආපසු ඒ සියලු පොතපත ඉගෙනීමේ කටයුතු හමාර කොට ආපසු එන විට ඉර හැංගී ඇත. ඉරෙන් හඳෙන් එහි එළියෙන් ළමා වියේ දරුවන් විඳින සුන්දර අත්දැකීම් වෙනුවට අද දරුවන්ට සිදුවී ඇත්තේ, ගුරු දෙගුරුන් සතුටු කිරීමට පොත පතේ දැනුම ලබා, විභාග ජයගෙන ඉදිරිමග සලසා ගැනීමටය. මෙවන් සමාජ විපර්යාසයක් සිදු වී ඇත්තේ දවසින් දෙකෙන් නොවූවද එහි අහිතකර බලපෑම් අද දරුවන් විඳින ආකාරය සිසිර දිසානායක අතින් නිම වුණ මෙම අරුත් බර ගීයෙන් ප්‍රතීයමාන වෙයි.

මෙනයින් බලන කල සාහිත්‍ය කරණයේ නියුතු නවකතා කරුවා, කෙටිකතා කරුවා, කවියා හෝ ගී පද රචකයා සැබවින්ම සමාජය දෙසට එල්ල වන කිසියම් ප්‍රබල කරුණක් තම ගීතය හෝ අන් කවර නිර්මාණයක් මගින් හෝ සමාජය වෙත සන්නිවේදනය කර ලීමට යොමු විය යුතුයි. සාහිත්‍යය කියවන්නා, හද-රන්නා මෙන්ම එහි රසය උපරිම ලෙස විඳගන්නා ද එමගින් ජීවිතයට අර්ථවත් යමක් එක් කර ගනියි. ඒ සඳහා අවශ්‍ය පසුබිම සකසා දීමේ මහඟු කාර්යය නිර්මාණ කරුවා සතුව පවතී. විශේෂයෙන්ම ගීත රච-නයේදී කලාකරුවකු තමා සමාජය වෙතින් ලබන අත්දැකීම මගින් තම සිත තුළ ඇති කළ කම්පනය සිය ප්‍රතිභාව නමැති අවියෙන් මුවහත් කොට සමාජය වෙත ආපසු ප්‍රදානය කළ යුතුයි. ගීත රචනයෙහිලා සහජ කුසලතා සපිරි, ඉහත දැක්වූ ගී පද රචකයන් මෙන්ම අන් බොහෝ දක්ෂ ගීත රචකයන් විසින් ද කරනු ලබන්නේ එම විශිෂ්ට කර්තව්‍යයයි.

IMMIGRATION LAW @
Australian Immigration Law firm
of the Sri Lankan Community

We are proud to have lead the way
for others to follow...

Professional Immigration
Legal Services
Legal Advice in simple to complex
Immigration matters

- Skill Assessments
- State Sponsorships Expression of Interest (EOI)
- Visa Lodgments
- Employer Sponsorships & Nominations
- Migration Review Tribunal Appeals
- Federal Court Appeals
- Ministerial Appeals

General Skill Migration
457 Visas
Employer Nominated Migration
Student Visas
Graduate Skill Visas
Permanent Residence Pathways
Spouse Visas
Contributory Parent Visas
Business Migration
Resident Return Visas

A Team of Qualified & Experienced
Lawyers & Registered Migration Agents

Susantha Katugampala
Principal
Barrister & Solicitor
Accredited Immigration Law Specialist
MARN: 9601070

LAW INSTITUTE OF VICTORIA ACCREDITED SPECIALIST

FAIRFIELDS LAWYERS
AUSTRALIA GATEWAY
Australian Immigration Law Advisory

10 Morrison Place
East Melbourne 3002
Australia
T: 03 9650 4557
1300 888 331
M: 0417 851 041

Suite 602, Hilton Colombo
Residence 200
Union Place, Colombo 2
Sri Lanka
T: +94 11 2300 627
M:+94 777 347 670

info@fairfieldslawyers.com

We Deliver Results...